විශේෂ නිවේදනයයි

රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ කොරියානු භාෂා පරීක්ෂණයෙන් සමත් කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ වෙබ් අඩවියේ දත්ත ලැයිස්තුවේ රැදී සිටින සියලුම රැකියා අපේක්ෂකයින් වෙතයි .

කොරියානු විභාගයෙන් සමත්ව දත්ත වෙබ් අඩවියට ඇතුළත් කර කොරියානු මානව සම්පත්සංවර්ධන ආයතනය මගින් අනුමත කිරීමෙන් පසු, දත්ත ලැයිස්තුවේ (Roster) හි රැදී සිටිනරැකියා අපේක්ෂකයින් තෝරා ගැනීම සේවා යෝජකයින් විසින් සිදු කරනු ලබයිඑහෙත් තෝරා . ගෙන සේවා ගිවිසුම් ලැබුණ ද විවිධ හේතු මත ඇතැම්රැකියා අපේක්ෂකයින් විදේශගතවීම ප්‍රතික්ෂේප කරන අවස්ථා ඇත.

මෙම හේතුව නිසා කොරියානු සේවා යෝජකයින් ද දැඩි අපහසුතාවයට පත්වන අතර කොරියානුරැකියා සදහා පිටත්වීමට නියමිතව සිටින රැකියා අපේක්ෂකයින්ට කොරියාවට ඇතුල්වීමට ප්‍රමාද වීම සිදුවේ.එමෙන් ම රැකියා අපේක්ෂකයින් සදහා ගිවිසුම් නොලැබීමේ අවධානමට ද අනිවාර්යෙන් ලක්වනු ඇත.මෙම කරුණු කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය මගින් විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ලිඛිත දැනුම් දීමක් කර ඇත .

එබැවින් ඔබ කුමන හෝ හේතුවක් මත කොරියානු මානව සම්පත්සංවර්ධන ආයතනයේ වෙබ් අඩවියේ දත්ත ලැයිස්තුවේ (Roster) රැදීසිටීමට (අකමැති නම් ඒ බව ලිඛිතව ඔබගේ අත්සනින් යුත් ලිපියක් මගින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ බදවාගැනීම් කොරියානු අංශයේ පරිගණක ඒකකයේ පහත සදහන් ඊමේල් ලිපිනය වෙත එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

koreanit2026@slbfe.lk

ඒ අනුව කොරියානු මානව සම්පත්සංවර්ධන ආයතනයේ වෙබ් අඩවියේ දත්ත ලැයිස්තුවෙන් (Roster) ඉවත් කරන රැකියා අපේක්ෂකයින් ,කුමන හේතුවක් මත හෝ නැවත එම විභාගය යටතේ වෙබ් අඩවියේ නැවත ලියාපදිංචි කිරිමක් සිදුකළ නොහැකි බවත් කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය වැඩිදුරටත් දැනුම්දී ඇත.

මේ සදහා ඔබ ලබාදෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

කළමනාකරු
බදවාගැනීම් (කොරියානු)
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය